කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

2012 වර්ෂයේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ පාලන වාර්තාව

1. දැක්ම

කාලගුණය, දේශගුණය සහ පූර්ව දැනුම් දීම් වලට අදාල සේවා සම්බන්ධයෙන් විශිෂ්ඨත්වයේ මධ්‍යස්ථානයක් බවට පත්වීම.

2. මෙහෙවර

රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය හා මහජනතාව වෙත කාලගුණ විද්‍යා, ගගන කාලගුණ විද්‍යා, සමුද්‍ර කාලගුණ විද්‍යා, ජල කාලගුණ විද්‍යා, කෘෂි කාලගුණ විද්‍යා, දේශගුණ විද්‍යා සහ ජ්‍යෝතිෂයට අදාලව ජාතික වැදගත්කමකින් හා අන්තර්ජාතික ප්‍රමිතියකින් යුතු සේවා සැපයීම.

3. අරමුණු

- ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ (WMO) ප්‍රමිතීන්ට අනුකූලව කාලගුණික රාශීන් නිරීක්ෂණය කිරීම හා පරීක්ෂා කිරීම සහ දේශගුණ විද්‍යාවට අදාල දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම.
- ජාතික අධිකාරියක් වශයෙන් කාලගුණික සහ දේශගුණික සේවා සැපයීම.
- කාලගුණික සිද්ධීන් හා සුනාමි පිළිබඳ පූර්ව අනතුරු හැඟවීම හා උපදේශන ලබා දීම.
- ලෝක කාලගුණ විද්‍යා සංවිධානය සහ අන්තර් ජාතික සිවිල් ගුවන් සේවා සංවිධානය විසින් නියම කර ඇති තාක්ෂණික නියමයන්ට අනුව, ජාතික හා අන්තර් ජාතික ගුවන් සේවාවලට අවශ්‍ය වන කාලගුණ සේවා සැපයීම.
- කාලගුණ විද්‍යාව, දේශගුණ විද්‍යාව, දේශගුණ විපර්යාස හා ආශ්‍රිත විෂයයන් පිළිබඳ අධ්‍යයනය සහ පර්යේෂණ හා අධ්‍යයන සඳහා ධෛර්යමත් කිරීම.
- නක්ෂත්‍ර හා භූ චුම්භක සම්බන්ධව සීමිත සේවාවන් ප්‍රමාණයක් සැපයීම.

4. පසුබිම

දෙපාර්තමේන්තුව ආපදා කළමණාකරණ අමාත්‍යාංශය යටතේ පැවති අතර වැඩිවන කාලගුණ සහ දේශගුණ ව්‍යසන සහ වර්තමානයේ එම සේවා සඳහා වැඩිවන ඉල්ලීම් ගැන සැලකිල්ලට ගෙන දෙපාර්තමේන්තුව නවීකරණය සඳහා යෝජනාවලියක් පිළිබඳව අමාත්‍ය මණ්ඩලයට සංදේශයක් ඉදිරිපත් කරන ලද අතර එය අනුමත කොට ඇත. අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලත් එම ව්‍යාපෘතියට අනුව, අවශ්‍ය ප්‍රතිපාදන සඳහා කටයුතු කෙරෙමින් පවතී.

5. නිලධාරී මණ්ඩලය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, කාලගුණ විද්‍යා අධ්‍යක්ෂ ජනරාල් යටතේ පාලනය වේ. කොළඹ පිහිටි දෙපාර්තමේන්තුවේ මුලස්ථානයට අමතරව කාලගුණ විද්‍යා කාර්යයාල 21 ක් රට පුරා පිහිටුවා ඇත.

කාලගුණ අනාවැකි සහ පූර්ව අනතුරු නිකුත් කිරීම සිදුකරන ලබන ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය සහ පර්යේෂණ, දේශගුණික, වර්ෂාපතන, කෘෂිකාලගුණ, රේඩාර්/රේඩියෝසොන්ඩ් , පරිගණක සහ දේශගුණ වෙනස්වීම පිලිබඳ තාක්ෂණ අංශයන් කොළඹ මුලස්ථාන කාර්යාලයේ පිහිටුවා ඇත.

ඉලෙක්ට්‍රොනික උපකරණ නඩත්තු කිරීම සහ පවත්වාගෙන යනු ලබන ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු අංශය, උපකරණ අංශය, මුදල් අංශය සහ පරිපාලන අංශය දෙපාර්තමේන්තු මුලස්ථානයේ පිහිටා ඇත. කටුනායක සහ රත්මලාන ගුවන්තොටුපොළ කාලගුණ විද්‍යා කාර්යයාල පිළිවෙලින් අන්තර්ජාතික සහ දේශීය ගුවන් ගමන් සඳහා කාලගුණ විද්‍යාත්මක සේවාවන් ලබා දීම සිදුකරයි.

2012.03.29 සහ 2012.08.14 දිනැති ලිපි මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද නව කාර්යය මණ්ඩලයට අනුව දෙපාර්තමේන්තුවේ මුළු කාර්යය මණ්ඩලය ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 52 කින්ද, තෘතීය මට්ටමේ නිලධාරීන් 29 කින්ද, ද්විතීය මට්ටමේ නිලධාරීන් 238 කින් සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 140 කින්ද සමන්විත විය (මුළු සංඛ්‍යාව 459කි). ඒ අතුරින් ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 32 ක්, තෘතීය මට්ටමේ නිලධාරීන් 03 ක්, ද්විතීය මට්ටමේ නිලධාරීන් 176 ක් සහ ප්‍රාථමික මට්ටමේ නිලධාරීන් 72 කින් සමන්විත 283 ක් වන සේවක සංඛ්‍යාවක් 2012 දෙසැම්බර් 31 දින වනවිට සේවයේ යෙදුනි. නව ප්‍රතිව්‍යුහගත යෝජනා අනුව අනුමත පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ කටයුතු ආරම්භ කොට ඇත.

2012 වර්ෂය ඇතුලත කාලගුණවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ සිදු වූ සංශෝධන පහත දැක්වේ.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ DMS/C04/12-05 අංක සහිත 2012.03.29 දිනැති නව කාර්යය මණ්ඩල අනුමැතියට අනුව දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව 357 සිට 449 දක්වා වැඩි වූ අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ DMS/C04/12-05 අංක සහිත 2012.08.14 දිනැති ලිපිය මගින් වැඩසටහන් නිලධාරී තනතුරු 10 ක් අනුමත කිරීමත් සමග කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ මුළු සේවක සංඛ්‍යාව 459 දක්වා වැඩි විය. ඒ අනුව දැනට අනුමත පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ කටයුතු ආරම්භ කොට ඇත.

කාලගුණවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්ව සිටි ජී.බී.සමරසිංහ මහතා වසර 60 සම්පූර්න්වීම මත 2012.03.23 දින සිට සේවයෙන් විශ්‍රාම ගැනීම හේතුවෙන් පුරප්පාඩු වූ අධ්‍යක්ෂ ජනරාල් තනතුරට, අමාත්‍ය මණ්ඩලය විසින් එවකට ජ්‍යේෂ්ඨතම අධ්‍යක්ෂ එස්.එච්.කාරියවසම් මහතා

2012.03.24 දින සිට පත් කරන ලදී. නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩී.ජේ.ඒ.වීරවර්ධන මහතා එදින සිට අධ්‍යක්ෂ තනතුරකටද, ජේෂ්ඨතම කාලගුණ විද්‍යාඥ ඒ.කේ.කරුණානායක මහතා එදින සිට නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරකටද පත් කරන ලදී. කාර්යය මණ්ඩල ප්‍රතිව්‍යුහගත යෝජනාවලියට අනුව, ජේෂ්ඨතම නියෝජ්‍ය අධ්‍යක්ෂ වරයාව සිටි එස්.ආර්.ජයසේකර මහතා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂ එම්.ඩී.දයානන්ද මහතා අධ්‍යක්ෂ තනතුරු වලට 2012.03.29 දින සිට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය අනුව පත් කරන ලදී.

දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කල කේ.එච්.එම.එස්.ප්‍රේමලාල් මහතා නියෝජිත පදනම මත 2012.08.24 දින සිට සාර්ක් කාලගුණ විද්‍යා පර්යේෂණ මධ්‍යස්ථානයේ විද්‍යාඥ තනතුර සඳහා වසර තුනක කාලයකට මුදා හරින ලදී. කාලගුණ විද්‍යා නිලධාරීන් වූ වී.එස්.දිසානායක මහත්මිය සහ පී.ජී.ඒ.ප්‍රේමරත්න මහතා ජනාධිපති කාර්යය මණ්ඩලයේ සේවය සඳහා පිළිවෙලින් 2012.10.26 දින හා 2012.12.13 දින සිට නිදහස් කරන ලදී.

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ට අමතරව 2012 වසර තුල විශ්‍රාම ලබා ගත් නිලධාරීන්ගේ විස්තර පහත දැක්වෙන පරිදි වේ.

අනු අංකය	නම	තනතුර	විශ්‍රාම ගිය දිනය
01	ජේ.ඒ.තිලකරත්න මහතා	කාලගුණ විද්‍යාඥ	2012.12.28
02	කේ.කේ.පියතිස්ස මහතා	කාලගුණ විද්‍යාඥ	2012.03.27
03	කේ.පී.ඩී.ආර්.ඒ.කරුණානායක මහතා	ජ්‍යෙෂ්ඨ කාලගුණ විද්‍යා නිලධාරී	2012.02.05
04	සී.හෙට්ටිආරච්චි මහතා	ජ්‍යෙෂ්ඨ කාලගුණ විද්‍යා නිලධාරී	2012.10.24
05	එම්.කේ.පී.බී.ජේ.ඩී. පෙරේරා මහතා	ජ්‍යෙෂ්ඨ සන්නිවේදක නිලධාරී	2012.03.16
06	වී. පුෂ්පනාදන් මහතා	කාලගුණ විද්‍යා නිරීකෂක	2012.01.26
07	ර්.ජී.උපාලි මහතා	කාලගුණ විද්‍යා නිරීකෂක	2012.04.09
08	එච්.ජී.සී.කේ.කාරියවසම් මහතා	කාලගුණ විද්‍යා නිරීකෂක	2012.04.01
09	ජේ.ස්ටීවන් මහතා	කළමනාකරණ සහකාර	2012.08.12
10	ඩී.ඒ.ආර්.රණවක මහතා	කාලගුණ විද්‍යා සහායක	2012.06.13

තවද 2012 වර්ෂයේ නව පත්වීම් ලැබූ, ස්ථාන මාරුවීම් ලැබූ, සේවයෙන් ඉවත්වගිය සහ වෙනත් ස්ථානයකට මාරුවීම් ලැබූ නිලධාරීන් පිළිබඳව පහත සඳහන් වගු වලින් දැක්වේ.

නව පත්වීම් ලද නිලධාරීන්

නම	අදාල වන සේවය	තනතුර	පත්වීම් භාරගත් දිනය
යූ.පී.ඒ.ටී.දිලුමි කරුණානායක මෙනවිය	ශ්‍රී ල. පරිපාලන සේවය	සහකාර අධ්‍යක්ෂ (පාලන)	2012.01.02
ඒ.සී.එම්.රොද්‍රිගු මහතා	ශ්‍රී ල. විද්‍යාත්මක සේවය	කාලගුණ විද්‍යාඥ	2012.01.16
ඒ.එච්.පී.පී.කරුණාපාල මෙනවිය	ශ්‍රී ල. විද්‍යාත්මක සේවය	කාලගුණ විද්‍යාඥ	2012.02.03

ස්ථාන මාරුවී පැමිණි නිලධාරීන්

නම	අදාල වන සේවය	තනතුර	සේවයට වාර්තාකළ දිනය
ඩබ්.ජී.කේ. අරුණශාන්ති මිය	ශ්‍රී ල. ගණකාධිකාරී සේවය	ගණකාධිකාරී	2012.09.10

සේවයෙන් ඉවත්වගිය නිලධාරීන්

නම	අදාල වන සේවය	තනතුර	සේවයෙන් ඉවත්ව ගිය දිනය
කේ.ජී.පී.ඩී.වයි.කුලසේකර මයා	ශ්‍රී ල. තාක්ෂණ සේවය	කා. වි. නිරීක්ෂක (පුහුණු)	2012.03.13
ආර්.ඩබ්.ඩී.ඩබ්. රාජසේකර මයා	ශ්‍රී ල. තාක්ෂණ සේවය	කා. වි. නිරීක්ෂක (පුහුණු)	2012.03.13
කේ.එල්.ජී.ඩබ්.ගුණතිලක මෙනවිය	ශ්‍රී ල. තාක්ෂණ සේවය	විදුලි සංදේශ හා රේඩාර් ශිල්පී	2012.03.26
එස්.එම්.ඩී.ඩී.සේනාරත්න මෙනවිය	ශ්‍රී ල. තාක්ෂණ සේවය	විදුලි සංදේශ හා රේඩාර් ශිල්පී	2012.03.26
ඩී.යූ.ඒ.ප්‍රනාන්දු මයා	ශ්‍රී ල. තාක්ෂණ සේවය	විදුලි සංදේශ හා රේඩාර් ශිල්පී	2012.03.26
එච්.එම්.ඊ.එල්.හලුවන මෙනවිය	රා. කලමනා. සහකාර සේවය	කලමනාකරණ සහකාර	2012.03.19

ස්ථාන මාරුවීම් ලබාගිය නිලධාරීන්

නම	අදාල වන සේවය	තනතුර	ස්ථාන මාරුවීම් ලබාගිය දිනය
ඩී.යූ.ඒ. එදිරිසිංහ මිය	ශ්‍රී ල. ගණකාධිකාරි සේවය	ගණකාධිකාරී	2012.09.11
ඩබ්.එච්.කේ.එම්.ද සිල්වා මයා	රා. කලම. සහකාර සේවය	කලමනාකරණ සහකාර	2012.09.17
ඩබ්.කේ.එච්.සඳරුවන් මයා	ශ්‍රී ල. තාක්ෂණ සේවය	විදුලි සංදේශ හා රේඩාර් ශිල්පී	2012.05.03
පී.අබේනායක මෙනවිය	රා. කලම. සහකාර සේවය	කලමනාකරණ සහකාර	2012.05.10

2012.09.27 වන දින සිට සේවයට වාර්තා නොකිරීම හේතුවෙන් කලමනාකරණ සහකාරවරයෙකු ලෙස සේවය කරන ලද යූ.එල්.බී.සාමාන් මහතාට 2012.09.27 දින සිට සේවයේ හැර යාමේ නිවේදනය නිකුත් කිරීමට අධ්‍යක්ෂ ජනරාල් විසින් කටයුතු කරන ලද අතර කාර්යාල කාර්යය සහයක ඩබ්.පී.වික්‍රමාරච්චි මහතා 2012.05.11 දින හදිසියේ අභාවප්‍රාප්ත විය.

2012 වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය අනුව කලමනාකාර සහකාර සේවයේ I පන්තියේ නිලධාරිනියක ස්ථාන මාරු වීම් ලබා දෙපාර්තමේන්තුවෙන් පිටතට ගිය අතර ඒ වෙනුවට කලමනාකර සහකාර සේවයේ III පන්තියේ නිලධාරිනියක සේවයට වාර්තා කරන ලදී.

2012 වාර්ෂික ස්ථාන මාරු අනුව ඒකාබද්ධ රියදුරු සේවයේ නිලධාරියෙකු සහ කාර්යාල සේවක සේවයේ නිලධාරීන් දෙදෙනෙකු දෙපාර්තමේන්තුවෙන් පිටතට ගිය අතර ඒ වෙනුවට පිටතින් නිලධාරීන් තිදෙනෙකු සේවයට වාර්තා කරන ලදී.

දෙපාර්තමේන්තුවේ ආරක්ෂක කටයුතු සහ සනීපාරක්ෂක කටයුතු බාහිර පාර්ශවයනට ලබා දීමට තීරණය කිරීම හේතුවෙන් ද මෙහි සේවය කල කාර්යාල සේවක සේවයේ නිලධාරීන් දෙදෙනෙකු අනුප්‍රාප්තිකයින් රහිතව මුදා හරින ලදී.

මේ අනුව වසර අවසානයේදී 459 ක් වන අනුමත සේවක මණ්ඩලයෙන් සේවකයින් 283 ක් සේවය කළහ.

6. දෙපාර්තමේන්තුවේ සංවර්ධන කාර්යයන්

දෙනියාය ගොංගල කඳු මුදුනේ සවි කිරීමට නියමිත ඩොප්ලර් රේඩාර් යන්ත්‍රය සඳහා අදාල කුළුණු, ගොඩනැගිලි සාදා අවසන් කරන ලදී. කුළුණට උපකරණ එසැවීමට දොඹකරය ගෙනයන විට අනපේක්ෂිතව පෙරලියාමෙන් මාර්ගයේ කොටසක් අබලන්වූ අතර උපකරණ සවිකිරීම ප්‍රමාද විය. මාර්ගය පිළිසකර කිරීම ආරම්භ කර ඇති අතර 2013 වර්ෂයේ මාර්තු මස උපරකරණ සවිකිරීමට කටයුතු යොදා ඇත.

යාපනය නව කාර්යයාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු අදියර දෙකකින් සිදුකිරීමට සැලසුම් කර තිබූ අතර පළමු අදියර එනම් කාර්යයාල සඳහා නේකෝර්ඩ් (NECORD) ආධාර ලැබුනු අතර වසර අවසාන වනවිට කාර්යයාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු අවසන් කරන ලදී. මෙහි දෙවන අදියරේ වැඩ (ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම, උපකරණ කොටුව සකස් කිරීම සහ ආරක්ෂක වැට ඉදිකිරීම) සඳහා මුදල් ප්‍රතිපාදන නොමැති නිසා ආරම්භ කල නොහැකි විය. මෙහි නව නිලනිවාස ගොඩනැගිල්ල ඉදිකිරීම දෙපාර්තමේන්තු අරමුදල් මගින් අරඹා ඇති අතර 90% ක පමණ ඉදිකිරීමේ වැඩ අවසන්කර ඇත. 2013 වසර ආරම්භයේදී නව කාර්යයාල ගොඩනැගිල්ලේ සිට කාර්යයාලය ආරම්භ කිරීමට කටයුතු යොදා ඇත.

ත්‍රිකුණාමලය නව කාර්යයාලය සඳහා ඉඩම් කොටසක් පවරා ගෙන ඇති අතර පළමුව එහි නිල නිවාසය ඉදිකිරීමේ කටයුතු දෙපාර්තමේන්තු අරමුදල් යොදාගනිමින් ආරම්භ කරන ලදී. මේ අතර ඉඩමේ අයිතිය පිලිබඳ විරෝධතාවයක් මතුවීම නිසා එම ආරවුල් නිරාකරණය කරන තෙක් ඉදිකිරීම් කටයුතු තාවකාලිකව ඇන හිටිනි. නිරවුල්කරණ ක්‍රයාවලිය අදාල ප්‍රාදේශීය ලේකම් මගින් සිදුවෙමින් පවතී.

වවුනියාව සහ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලවල අලුත්වැඩියා කටයුතු සිදුකරන ලදී. මන්නාරම කාර්යාලයේ අලුත් වැඩිය කටයුතු සහ නුවරඑළිය සංචාරක බංගලාවේ බංගලා භාරකරු සඳහා නිලනිවාසයක් ඉදිකිරිම ආරම්භ කරන ලද අතර එම කටයුතු සිදු කෙරෙමින් පවතී.

කොයිකා (KOICA) ආධාර වැඩ සටහන යටතේ කොරියානු සන්නිවේදන, සාගර, කාලගුණික කටයුතු සඳහා වූ චන්ද්‍රිකාව මගින් දත්ත ලබාගැනීමේ ව්‍යාපෘතියට අදාල පුහුණු වීම් අවසන් වි ඇති අතර එම චන්ද්‍රිකා ඡායාරූප සහ දත්ත අනාවැකිකරන කටයුතු සඳහා යොදාගැනේ.

මහජන චීන ආධාර යටතේ චීන කාලගුණ පරිපාලන ආයතනය (CMA) විසින් චන්ද්‍රික තොරතුරු ප්‍රතිග්‍රාහක උපකරණ ද ස්ථාපිත කොට ඇත.

7. භූ තල නිරීක්ෂණ

අනුරාධපුර, මඩකලපුව, කොළඹ, ගාල්ල, හම්බන්තොට, කටුගස්තොට, කටුනායක, නුවර-එළිය, පුත්තලම, රත්මලාන, රත්නපුර, පොළොන්නරුව සහ ත්‍රිකුණාමලයේ හි පිහිටි කාලගුණ විද්‍යා නිරීක්ෂණ මධ්‍යස්ථාන මගින් දවසේ පැය 24 පුරා කාලගුණ නිරීක්ෂණ සිදු කෙරිණි. ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරු භූමියේ පිහිටි මධ්‍යස්ථානයේ නිරීක්ෂණ කටයුතු, නාවුක නිලධාරීන් මගින් නොකඩවා සිදු කරගෙන යාම සිදු විය.

බදුල්ල, බණ්ඩාරවෙල, කුරුණෑගල, මහඉලුප්පල්ලම, මන්නාරම, මොණරාගල, පොලොන්නරුව, පොතුවිල්, වව්නියාව සහ යාපනය කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන මඟින් පැය 0530 සිට පැය 2030 දක්වා දිනකට පැය 16ක කාලයක් නිරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. ලෝක

කාලගුණ විද්‍යා සංවිධානයේ (WMO) තාක්ෂණික උපදේශ සහ කොන්දේසි වලට අනුව, ග්‍රිනිච් සම්මත වේලාවෙන් පැය 0000, 0300, 0600, 0900, 1200, 1500, 1800 සහ 2100 යන වේලාවන් වල දී කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලින් නිරීක්ෂණය කරනු ලබන වර්ෂාපතනය, පීඩනය, උෂ්ණත්වය, ආර්ද්‍රතාවය, සුළඟේ වේගය/දිශාව, දෘශ්‍යතාවය, වලාකුළු වර්ගය/ප්‍රමාණය යන පරාමිතීන් එසැණින්ම කොළඹ පිහිටි ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය (NMC) වෙත ලැබීමට සලස්වනු ලැබිණ. මෙලෙස වසර තුළ දී ලබාගන්නා ලද භූතල නිරීක්ෂණ ප්‍රමාණය 56,925 ක් විය.

8. ඉහළ වායුගෝලීය නිරීක්ෂණ

පහල වායුගෝලයේ විවිධ උස මට්ටම් වල දී සුළඟේ වේගය හා දිශාව ගණනය කිරීම සඳහා රේඩාර් බැලූන් නිරීක්ෂණය කොළඹ දී සිදු කෙරිණි. මෙහි දී ග්‍රෑම් 100 වන බැලූනයක් භාවිතයෙන් ග්‍රිනිච් සම්මත වේලාවෙන් පැය 0600 ට සහ ග්‍රෑම් 350 බැලූනය භාවිතයෙන් ග්‍රිනිච් සම්මත වේලාවෙන් පැය 1200 ට මෙම නිරීක්ෂණයන් සිදු කරනු ලැබීය.

ඉහළ වායුගෝලයේ විවිධ උස මට්ටම් වල දී පීඩනය, උෂ්ණත්වය සහ සාපේක්ෂ ආර්ද්‍රතාවය ගණනය කිරීම සඳහා ග්‍රිනිච් සම්මත වේලාවෙන් පැය 0600 දී රේඩියෝ සොන්ඩ් නිරීක්ෂණ උපකරණය භාවිත කිරීම කොළඹ කාර්යාලයේදී සතියකට තෙවතාවක් සිදු කරනු ලැබීය. මේ සඳහා ලෝක කාලගුණ විද්‍යා විධාන (WMO) ස්වේච්ඡා සහයෝගිතා වැඩසටහන යටතේ, ජපන් රජයෙන් පරිත්‍යාග කරන ලද GPS සහිත රේඩියෝ සොන්ඩ් උපකරණ භාවිතා කරන ලදී. උපකරණයේ දෝශ හේතුවෙන් මාස කිහිපයක් නිරීක්ෂණ කටයුතු කිරීමට නොහැකිවිය. මේ අනුව, වර්ෂය තුල රේඩියෝ සොන්ඩ් නිරීක්ෂණ 82 ක් සිදු කරන ලදී. හම්බන්තොට, පුත්තලම සහ පොළොන්නරුව මධ්‍යස්ථාන වල දී ග්‍රිනිච් සම්මත වේලාවෙන් පැය 0000, 0600 සහ 1200 දී නියාමක බැලූන් නිරීක්ෂණ සිදු කොට ඉහළ වායුගෝලීය සුළං වේගය හා දිශාව ගණනය කරන ලදී. මීට අමතරව, ග්‍රිනිච් සම්මත වේලාවෙන් පැය 0000 දී සහ තාක්ෂණික හෝ වෙනයම් හේතුවක් මත රේඩාර් සුළං නිරීක්ෂණය අවලංගු කරන ලද අවස්ථාවන් වල දී, අතිරේක ලෙස නියාමක බැලූන් නිරීක්ෂණ කොළඹ දී ද සිදු කරන ලදී. මේ අනුව 2012 මුළු වසර ඇතුලත කොළඹ, හම්බන්තොට, පොළොන්නරුව සහ මන්නාරම යන මධ්‍යස්ථාන වල දී පිළිවෙලින් බැලූන්(සුළං) නිරීක්ෂණ 921, 1038, 950 සහ 1019 බැගින් සිදුකරන ලදී. කෙසේ වෙතත්, අයහපත් කාලගුණය සහ අවට බාධක වලින් බැලූන් ආවරණය වීම ආදිය නිසා ඇතැම් නිරීක්ෂණ අසාර්ථක විය.

9. ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය (NMC)

මහජනතාව සඳහාත්, ධීවර සහ නාවික කටයුතු සඳහාත්, අභ්‍යන්තර ගුවන් ගමන් සඳහාත් කාලගුණ අනාවැකි සහ අයහපත් කාලගුණ තත්ත්වයන් පිළිබඳව අනතුරු ඇඟවීම් නිවේදන නිකුත් කිරීම ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය මඟින් නොකඩවා සිදු කරන ලදී. අමාත්‍යාංශය

මඟින් මෙහෙයවන ධීවර ප්‍රජා ගුවන් විදුලියට දිනපතා විශේෂ කාලගුණ අනාවැකි නිකුත් කිරීම ද වසර පුරා සිදු කරන ලදී. වසර පුරා ජනමාධ්‍ය මඟින් දුරකථන විමසුම් 9675 ක් පමණ ප්‍රමාණයක දී, කාලගුණ අනාවැකි 1551 ක් සහ අයහපත් කාලගුණය පිළිබඳව නිවේදන 27 ක්ද, සුනාමි පිළිබඳව අනතුරු ඇඟවීම් නිවේදන 03 ක්ද නිකුත් කරන ලදී. තවද, ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ අනෙකුත් අභ්‍යන්තර ගුවන් ගමන් මෙහෙයවන්නන් සඳහා ද ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පැරෂුට් අභ්‍යාස සඳහාද අවශ්‍ය කළ අනාවැකි 5730 ක් 2012.01.01 දින සිට 2012.07.09 දක්වා නිකුත් කරන ලදී (2012.07.10 දින සිට මේ සඳහා කලගුණ අනාවැකි නිකුත් කිරීම කටුනායක කාලගුණ විද්‍යා කාර්යලයෙන් සිදු කරන ලදී). ධීවර කටයුතු සඳහා වසර තුල දී කාලගුණ අනාවැකි 732 ක් නිකුත් කර ඇති අතර, එම කාලය තුල නාවුක ගමන් සඳහා නිකුත් කර ඇති අනාවැකි ප්‍රමාණය 1456 කි. වාණිජ ආයතන වල විවිධ අවශ්‍යතා සඳහා ඉල්ලුම්කරන ලද කාලගුණ වාර්තා 1892 ක් වසර තුල ලබා දී ඇති අතර, විශේෂයෙන් රක්ෂණ හිමිකම් ලබාගැනීමේ දී කාලගුණය පිළිබඳව වාර්තා 102 ක් නිකුත් කොට ඇත.

පැසිපික් සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය (PTWC), ජපන් කාලගුණ විද්‍යා සංගමය (JMA) සහ සුනාමි පිළිබඳව තොරතුරු ලබා දෙන කලාපීය සුනාමි අනතුරු (RTSP) මධ්‍යස්ථාන සමඟින් නිකුත් කරනු ලබන සුනාමි තොරතුරු ප්‍රතිග්‍රහණය සහ මහජනතාවට සුනාමි පිළිබඳව අනතුරු ඇඟවීම් නිකුත් කිරීමේ වගකිවයුතු ආයතනය ලෙස ද, ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය ක්‍රියා කරනු ලැබීය.

2012.07.10 දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ අනෙකුත් අභ්‍යන්තර ගුවන් ගමන් මෙහෙයවන්නන් සඳහා ද ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පැරෂුට් අභ්‍යාස සඳහාද අවශ්‍ය කළ අනාවැකි 5080 ක් කටුනායක කාලගුණ විද්‍යා කාර්යයාලයෙන් නිකුත් කරන ලදී.

10. කාලගුණ විද්‍යා සන්නිවේදන මධ්‍යස්ථානය

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, කාලගුණ අනාවැකි සැකසීම සඳහා අවශ්‍ය වන්නා වූ සියළුම ජාතික සහ කලාපීය කාලගුණ විද්‍යාත්මක දත්ත ලබාගැනීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි. ජාතික, කලාපීය සහ ලෝක කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන වලට සම්ප්‍රේෂණය කිරීම සඳහා, තෝරාගත් කාලගුණ විද්‍යා මධ්‍යස්ථාන සංඛ්‍යාවක කාලගුණ දත්ත, නවදිල්ලි හි පිහිටි කලාපීය මධ්‍යස්ථානයට සම්ප්‍රේෂණය කෙරේ.

කාලගුණ විද්‍යා සහ සුනාමි අනතුරු ඇඟවීම් හා උපදේශණ පිළිබඳ තොරතුරු, කි.බ./තත්.256 ධාරිතාවයකින් යුත් කොළඹ-නවදිල්ලි (GTS) සම්බන්ධතාවය හරහා කාර්යක්ෂමව ලබා ගැනුනි. කාලගුණ අනාවැකි සැකසීමට අවශ්‍ය වළාකුළු පිළිබඳ චන්ද්‍රිකා ඡායාරූප සහ සංඛ්‍යාත්මක අනාවැකිකරන ආකෘති (Numerical Model outputs) අන්තර්ජාලය හරහා ලබා ගැනීම මෙම අංශය මගින් සිදු කරනු ලදී.

11. කාලගුණ විද්‍යා කාර්යාලය - කටුනායක ගුවන් තොටුපළ

සඵලදායී හා ආරක්ෂා සහිත ගුවන් ගමනක් සඳහා කාලගුණ විද්‍යා තොරතුරු හා නිමිති ලබා දීම අත්‍යවශ්‍ය කාරණයකි. සෑම ජාත්‍යන්තර ගුවන් ගමනකදීම ගුවන් යානය පිටත් වීමට පැය තුනකට වත් පෙර අදාල වෙලාවේදී ගුවන් පථයේ සුළඟ, උෂ්ණත්වය, පීඩනය අයත් කාලගුණ නිමිත්තක්ද, අදාල ගම්නාන්තය දක්වා ඉහල වායුගෝලයේ කාලගුණ තත්වය පිලිබඳ (සුළඟ, උෂ්ණත්වය, වලාකුලු හා ඇතිවියහැකි බාධා ආදිය පිලිබඳ) නිමිත්තක්ද, ගමන්මගෙහි සියලුම ගුවන්තොටුපල වල කාලගුණ තොරතුරු සහිත වාර්තාවක් ගුවන් නියමුවාට ලබාදිය යුතුයි.

මේ අනුව කොළඹ ගුවන් තොරතුරු කලාපය (Colombo FIR) හරහා ගමන් කරන සහ කටුනායක ගුවන් තොටුපළ භාවිතා කරන, අන්තර් ජාතික ගුවන් යානා සඳහා සියළු කාලගුණ විද්‍යා දත්ත ලබා දීම, කටුනායක බණ්ඩාරනායක අන්තර්ජාතික ගුවන් තොටුපළෙහි පිහිටි කාලගුණ විද්‍යා කාර්යාලය මගින් සිදු කරන ලදී. මෙම ලබාදෙන ලද සේවය GTS සහ SADIS-2G සන්නිවේදන පද්ධති මගින් කාර්යක්ෂමව ඉටු කිරීමට හැකි විණි. සේවා ලබා ගත් ගගන යාත්‍රා ප්‍රමාණය 2012 වසරේද සැලකිය යුතු ලෙස වැඩිව පැවතුනි.

යුරෝපය සහ පෙරදිග ගමනාන්ත දක්වා නොනවත්වා පියාසර කරන ගුවන් ගමන් ඇතුළු, ජාත්‍යන්තර ගුවන් ගමන් සඳහා විවිධ පියාසර මට්ටම් වල සුළඟ හා උෂ්ණත්වය දැක්වෙන සිතියම්, ගුවන් මාර්ග අතරමග විශේෂ කාලගුණ තත්ත්වයන් සහ අනෙකුත් කාලගුණ විද්‍යා තොරතුරු ඇතුලත් ගොනු 24,517 ක් වසර තුල දී නිකුත් කරන ලදී. මීට අමතරව ගුවන්තොටුපල පර්යන්ත අනාවැකි (TAF) 1,474 ක්, පැය 1/2 වරක් ලබාගන්නා කාලගුණ වාර්තා (METAR) 17,306 ක්, විශේෂ කාලගුණ වාර්තා (SPECI) 411ක්, සැලකිය යුතු කාලගුණ තත්ත්වයන් පිළිබඳ වාර්තා (SIGMET) 136 ක් සහ ගුවන් තොටුපළ අනතුරු ඇඟවීම් (Aerodrome Warning) 40 ක් මෙම කාර්යාලයෙන් නිකුත් කෙරිණි.

මීට අමතරව 2012.07.10 දින සිට ශ්‍රී ලංකා ගුවන් හමුදාව සහ අනෙකුත් අභ්‍යන්තර ගුවන් ගමන් මෙහෙයවන්නන් සඳහා ද, ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පැරෂුට් අභ්‍යාස සඳහාද අවශ්‍ය කළ අනාවැකි නිකුත් කිරීම කටුනායක ගුවන් තොටුපළ කාර්යාලය මගින් සිදු කෙරින. වර්ෂයේදී මෙවැනි අනාවැකි 5080 ක් නිකුත් කර ඇත. (ඊට ඉහතදී මෙම අනාවැකි කොළොඹ ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයෙන් නිකුත් කිරීම සිදු කරන ලදී). දෙපාර්තමේන්තුවේ විද්‍යාත්මක හා තාක්ෂණ නිලධරින්ගේ ඌනතාවයන් තිබියදීත් මෙම රාජකාරීන් සාර්ථකව සිදු කරන ලදී.

12. කාලගුණ විද්‍යා කාර්යාලය - රත්මලාන ගුවන් තොටුපළ

රත්මලාන ගුවන් තොටුපළ මගින් මෙහෙයවනු ලබන අභ්‍යන්තර ගුවන් ගමන් මෙහෙයුම් සඳහා අත්‍යවශ්‍ය වන කාලගුණික තොරතුරු සැපයීම සහ දෛනිකව අවශ්‍ය කාලගුණ විද්‍යා නිරීක්ෂණ කටයුතු සිදු කිරීම මෙම කාර්යාලයේ ප්‍රධාන වශයෙන් සිදු කෙරිණි. ඒ ඒ අභ්‍යන්තර ගුවන් ගමන් සේවා සඳහා සහ ක්ෂේත්‍ර සඳහා වායුගෝලයේ විවිධ මට්ටම් වල සුළං ප්‍රවේගය,

උෂ්ණත්වය, කාලගුණය සහ වලාකුළු පිලිබඳව නිමිති ඇතුලත් නිමිති කොළඹ ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය මඟින් නිකුත් කරනු ලැබේ. කොළඹ ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානය මඟින් (2012.07.10 දින සිට කටුනායක කාලගුණ විද්‍යා කාර්යාලය මඟින්) නිකුත් කරනු ලබන ගුවන් ගමන් මාර්ග වල සහ ගුවන් ගමන් ආශ්‍රිත ප්‍රදේශ වල කාලගුණික අනාවැකි ලබාගෙන, ශ්‍රී ලංකා ගුවන් හමුදාවට (SLAF) සහ අනෙකුත් අභ්‍යන්තර ගුවන් ආයතන වලට ලබාදීම ද සිදු කෙරිණි. 2012 වසර තුළ දී එවැනි කාලගුණ අනාවැකි 10,805 නිකුත් කරන ලදී. ඊට අමතරව පැයෙන් පැය කාලගුණ වාර්තා (METAR) 4,989 ක් ද, විශේෂ කාලගුණ වාර්තා (SPECI) 271 ක් ද ගුවන් ගමන් කටයුතු සඳහා ලබාදෙන ලදී.

13. දේශගුණික විපර්යාස පිළිබඳ අධ්‍යයන කේන්ද්‍රය

දේශගුණ විපර්යාස පිලිබදව විද්වතුන්, පර්යේෂකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, ගුරුවරුන් හා පාසල් සිසුන් සඳහා සම්පාදනය කළ දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය ලබාදීම සිදුකරන ලදී. මෙම අංශය පර්යේෂණ අංශය සමග පර්යේෂණ කටයුතු සිදු කරනු ලැබූ අතර, මෙහි 20 වැනි අංකය යටතේ එම කටයුතු පිළිබඳව ද දක්වා ඇත.

14. කෘෂි කාලගුණික මධ්‍යස්ථාන

කෘෂි කාලගුණික මධ්‍යස්ථානය මඟින් පාලනයවන, වෙනත් ආයතන වල් පිහිටුවා ඇති කෘෂි කාලගුණික දත්ත මධ්‍යස්ථාන 44 න් මධ්‍යස්ථාන 37 ක් පමණක් සක්‍රීයව පැවතුණි. එම මධ්‍යස්ථාන 37 න් දත්ත එකතු කිරීම, එම දත්ත පරික්ෂා කිරීම සහ පරිගණක ගතකිරීම කරන ලදී. මෙහිදී, උපරිම සහ අවම උෂ්ණත්වය, තෘණ අවම උෂ්ණත්වය, වාෂ්පීකරණය, සූර්යාලෝක පැය ගණන, සුලගේ වේගය/දිශාව සහ පොළව මතුපිට සිට සෙ.මී. 05, 10,20 සහ 30 යන ගැඹුරු වලදී පසෙහි උෂ්ණත්වය යන පරාමිතීන් මැනීම කරනු ලැබේ. ආහාර සහ කෘෂිකර්ම සංවිධානයට (FAO) සති පතා වර්ෂාපතනයන් සහ යල-මහ කන්න වල වර්ෂාපතන වල ඓක්‍යයන්, සාමාන්‍ය වර්ෂාපතන, ලැබුණු වර්ෂාපතන අතර වෙනස ආදිය වැඩිදුර විශ්ලේෂණය සඳහා සපයන ලදී.

සපයන දත්ත වල තත්ත්වය ගුණාත්මකව වැඩි දියුණු කරගැනීම සඳහා එම ආයතනවල ප්‍රධානීන් කොළඹ ප්‍රධාන කාර්යාලයේදී සාකච්චාවක් පවත්වන ලදී. අබලන් වූ උපකරණ වෙනුවට අලුතින් උපකරණ මිලදී ගැනීමේදී දෙපර්තමේන්තුවේ සම්බන්ධීකරණය මගින් සිදු කිරීමටත්, නිරීක්ෂණ දත්ත ලබාගන්නා නිලධාරීන් සඳහා පුහුණු වැඩමුළු පැවැත් වීමට තීරණය වූ අතර ඒ අනුව අදාල නිලධාරීන් සඳහා 2012 ජුනි 4 සහ 5 දිනවලදී ගන්නොරුවේදීද, 2012 ඔක්තෝබර් 10 දින ලුනුවිලදීද පුහුණු වැඩමුළු 2ක් පවත්වන ලදී. මෙම වැඩ මුළු වල කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ පොල් පර්යේෂණ ආයතනය විසින් මුලික පහසුකම් සපයන ලදී.

නායයාමට ලක්වී වසර 8ක් වසා දමා තිබු දෙනියාය කෘෂිකර්ම මධස්ථානය යලි ආරම්භ කිරිමට කටයුතු යොදා ඇති අතර 2013 ජනවාරි මස ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ. පොල් පර්යේෂණ ආයතනය පර්යේෂණ මගින් ආරම්භ කිරීමට සුදානම් කර ඇති මිද්දෙනිය

මධ්‍යස්ථානය සඳහා අවශ්‍යය උපකරණ කොටස් දෙපාර්තමේන්තු කර්මන්තශාලාවේදී සකස් කරණ ලදී.

15. වර්ෂාමාන මධ්‍යස්ථාන

දිවයින පුරා විසිර පවතින වර්ෂාමාන ජාලය මධ්‍යස්ථාන 450 කට වැඩි වන අතර මධ්‍යස්ථාන 342 කින් වර්ෂාපතන දත්ත නියමිත පරිදි ලැබී ඇත. මෙම මධ්‍යස්ථාන රාජ්‍ය මෙන්ම රාජ්‍ය නොවන ආයතන සහ ස්වේච්ඡා නිරීක්ෂකයින්ගේ සහයෝගය ඇතිව පවත්වාගෙන යනු ලැබේ. දිනපතා පැය 0830 ට වර්ෂාපතනය ගණනය කරනු ලබන අතර, එම මාසය අවසානයේ එම දත්ත පිළිබඳව වාර්තාව, අප දෙපාර්තමේන්තුවට ලබාගැනීමට අවශ්‍ය කටයුතු යොදා ඇත. මේ අතුරින් මධ්‍යස්ථාන 190 ක පමණ දත්ත කාලගුණ අනාවැකි ඉදිරිපත් කිරීමේ දී ප්‍රයොජනයට ගැනීම සඳහා දෛනිකව දුරකථන මගින් ලබාගැනේ. වසර තුලදී නව වර්ෂාමාන මධ්‍යස්ථාන 39ක් පිහිටුවන ලද අතර, මධ්‍යස්ථාන 77ක් පරික්ෂා කොට අඩුපාඩු සකස් කරන ලදී.

16. පරිගණක අංශය

Clicom සහ Climsoft පද්ධති 2012 වර්ෂය තුළ දී ද සතුටු දායක ලෙස භාවිත කිරීමට හැකි වී ඇත. දත්ත නිකුත් කිරීම Clicom සහ Climsoft පද්ධති මගින් සිදු කරනු ලැබූ අතර දත්ත පරිගණකගත කිරීම Climsoft පද්ධති මගින් සිදු කරන ලදී. කාලගුණික නිරීක්ෂණ මධ්‍යස්ථාන වල දෛනික වර්ෂාපතන, උෂ්ණත්ව දත්ත සහ සාපේක්ෂ ආර්ද්‍රතා අගයන්ද වර්ෂාපතන නිරීෂණ මධ්‍යස්ථාන වල දෛනික දත්ත පරිගණක ගත කිරීමද හොඳින් පවත්වාගෙන යන ලදි. දත්ත ඉල්ලුම් කරන ආයතන සහ පුද්ගලයින් සඳහා මෘදු පිටපත් හෝ මුද්‍රිත පිටපත් ලබාදීම තවදුරටත් සිදු කරනු ලැබීය.

17. දේශගුණික දත්ත නිකුත් කිරීම

අවුරුදු ගණනක් තිස්සේ, ක්‍රමාණුකූලව රැස්කරණ ලද දේශගුණික දත්ත, විවිධ අංශ වලින් කෙරෙන සංවර්ධන ව්‍යාපෘතිවල, ශක්‍යතා අධ්‍යයන සහ සැළසුම් කිරීම් විශාල සංඛ්‍යාවකට සැපයීම, තවදුරටත් කරගෙන යන ලදී. තවද, පර්යේෂණ කටයුතු හා විශ්ව විද්‍යාල/ පාසැල් සිසුන්ගේ අධ්‍යයන කටයුතු වලට ද, මහ බැංකුවට, ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුවට, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට, සම්පත් පැතිකඩ යාවත්කාලීන කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් වරුන්ට සහ ඇතැම් දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ සංවර්ධන සැලසුම් කටයුතු සහ ප්‍රකාශන වලට අවශ්‍ය දේශගුණික දත්ත සහන මිලකට හෝ නොමිලේ ලබාදෙන ලදී.

18. නක්ෂත්‍ර / තාරකා විද්‍යාත්මක දත්ත සැපයීම

සූර්යා සහ චන්ද්‍රයා උදාවන් සහ බැසීමේ වේලාවන්, පහන් දැල්වීමේ වෙලාවන්, ග්‍රහ තාරකාවන්ගේ දෘශ්‍යතාවය, නව සඳ දැකීම්, සඳුගේ කලාවන්, ග්‍රහණයන් පිළිබඳ තත්ත්ව ගණනය කර රාජ්‍ය මුද්‍රණ සංස්ථාවට සහ අනෙකුත් අවශ්‍ය අංශ වලට ලබා දුනි. පෝය සහ රජයේ නිවාඩු පිළිබඳ කමිටුවේ සාමාජිකයකු ලෙස දෙපාර්තමේන්තුවේ ජ්‍යොෂ්ඨ නිලධාරියකුගේ සේවය තවදුරටත් සපයන ලදී.

19. භූ කම්පන හා සුනාමි තොරතුරු

ශ්‍රී ලංකාව ආශ්‍රිත ප්‍රදේශ වල සුනාමි තොරතුරු මෙන්ම භූ කම්පන පිළිබඳ නිරන්තර අවධානයෙන් සිට කැලිෆෝනියා ඒකාබද්ධ භූකම්පන ජාලය (CISN), පැසිපික් සුනාමි අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය (PTWC), ජපන් කාලගුණ විද්‍යා ඒජන්සිය (JMA) සහ සුනාමි පිළිබඳව තොරතුරු ලබා දෙන කලාපීය සේවා මධ්‍යස්ථාන (RTSP)වල සහයෝගය ඇතිව මහජනතාවට මෙන්ම වගකිවයුතු ආයතන වලට ප්‍රකාශන සහ උපදේශණ/අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සිදු කරන ලදි. වසර තුලදී සුනාමි අවස්ථා 03 ක දී අනතුරු ඇඟවීම් නිකුත් කරනු ලැබ ඇත. කටකතා සහ අසත්‍ය තොරතුරු හේතුවෙන් කලබලයට පත්වූ ජනතාවගේ විමසුම් වලටද තත්ත්වය පැහැදිලි කරමින් ප්‍රතිචාර දක්වා ඇත.

20. පර්යේෂණ කටයුතු

2012 දී පර්යේෂණ අංශය සහ දේශගුණ විපර්යාස පිළිබඳ අධ්‍යයන කේන්ද්‍රය එකතුව කරන ලද පර්යේෂණ පහත දැක්වේ.

1. කාලගුණ පර්යේෂණ සහ නිමිතිකරණ පරිගණක මොඩලයේ දත්ත (WRF Data), AWS දත්ත සමඟ විශ්ලේශණය
2. කාලගුණ පර්යේෂණ සහ නිමිතිකරණ පරිගණක මොඩලයේ දත්ත,(මාසික,ඍතුමය සහ පීඩන නුක්‍රමය) රේඛීය ප්‍රතිපායන විශ්ලේශණය මගින් වරෂාපතන අනාවැකිකරණය.
3. වර්ෂාපතන සහ උෂ්ණත්ව දත්ත විශ්ලේශණය (1990-2010)
4. SYNOP දත්ත විකේතනය සහ සිතියම් ගතකර ප්‍රදර්ශණය කිරීමෙහි ක්‍රමවේදය සකස් කිරීම.
5. AWS දත්ත සිතියම් ගතකර ප්‍රදර්ශණය කිරීමේ ක්‍රම ලේඛය සකස් කිරීම.
6. නිරිත දිග මෝසම් වර්ෂාපතනය ආරම්භය සඳහා සඳෙහි බලපෑම අධ්‍යයනය.
7. කාලගුණ පර්යේෂණ සහ නිමිතිකරණ පරිගණක මොඩලය (WRF) භාවිතා කර දින තුනක් සහ දින හතක් සඳහා අනාවැකිකරණය.
8. ආපදා සහ ආපදා කලමනාකරණය, දේශගුණ විපර්යාස , ස්වභාවික ආපදා තොරතුරු නිරූපණය සඳහා ලේඛන සකස් කිරීම .

9. දශක පදනම මත ශ්‍රී ලංකාවෙහි වර්ෂාපතන (1951-2010) සහ මධ්‍යන උෂ්ණත්ව (1900-2010) විශ්ලේශණය.

10. ශ්‍රී ලංකාව ආශ්‍රිතව පාරභෞම විකිරණ රටාව සඳහා අගයන් ලබා ගැනීම.

11. මෝසම් අක්‍රිය වීම සහ ආන්තික තත්ත්ව සඳහා SPI හි බලපෑම හඳුනා ගැනීම.

21. දෙපාර්තමේන්තුව නැරඹීමට පැමිණීම

පසුගිය වසරේ මෙන්ම පාසැල් ශිෂ්‍ය කණ්ඩායම් වල පැමිණීම සැලකිය යුතු ලෙස වැඩිව තිබිණි. මෙම වසර තුල පාසැල් ශිෂ්‍ය කණ්ඩායම් 188 ක් ලෙස පාසැල් සිසුන් 19,112 ක් ද, ආරක්‍ෂක අංශ සාමාජිකයින් 641 දෙනකු කණ්ඩායම් 15ක් ලෙස ද, උසස් අධ්‍යාපන ආයතන 11 කින් 597 ක්ද දෙපාර්තමේන්තුව (ප්‍රධාන කාර්යාලය) නැරඹීමට පැමිණ ඇත.

22. අකුණු ආරක්ෂණ කටයුතු

අකුණු අනතුරුවලින් ආරක්ෂාවීමේ ක්‍රමෝපායයන් සම්බන්ධව මහජනතාව දැනුම්වත් කිරීමද අඛණ්ඩව සිදු කෙරුණු අතර, අකුණු අනතුරු බහුල කෑගල්ල සහ කළුතර දිස්ත්‍රික්ක වල මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා අකුණු අනතුරුවලින් ආරක්ෂාවීමේ ක්‍රමෝපායයන් සම්බන්ධව දෙපාර්තමේන්තුව විසින් වැඩමුළු 08ක් අදාල කාලය තුලදී පවත්වා ඇත. මෙම වැඩමුළු ඉදිරියේදී අනෙකුත් දිස්ත්‍රික්ක සඳහාද ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වේ. මීට අමතරව, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය සමඟ ඒකාබද්ධව කරන ලද මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් වලදී සම්පත් දායකත්වය සපයන ලදී.

23. ශිෂ්‍යත්ව, පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණ

(අ). විදේශ පුහුණු වැඩසටහන්/සම්මන්ත්‍රණ සහ වැඩමුළු

අංකය	නම	විස්තර	ආධාර සපයන ලද ආයතනය
01	එම්.එම්.පී. මෙන්ඩිස් මයා	බෙංගාල බොක්ක ප්‍රදේශය සඳහා වන ප්‍රචණ්ඩ කාලගුණ තත්වයන් පිළිබඳ අනාවැකිකරනය දියුනු කිරීමේ ව්‍යාපෘතියේ තාක්ෂණික කටයුතු සැලසුම් කිරීමේ වැඩමුළුව - ඉන්දියාව : 23/01/2012 සිට 27/01/2012	WMO - ලෝ.කා.වි.ස.
02	ඒ.ආර්. වර්ණසූරිය මිය	ඉන්දියන් සාගරයේ සුළිසුළං සහ දේශගුණ විපර්යාස සඳහා 2වන අන්තර්ජාතික සමුළුව - ඉන්දියාව : 14/ 02/2012 සිට 17/02/2012	WMO - ලෝ.කා.වි.ස.
03	ඩී. ඒ ජයසිංහආරච්චි මයා	නිවර්තන සුළි සුළං අනාවැකිකරනය - ඉන්දියාව : 20/02/2012 සිට 02/03/2012	WMO - ලෝ.කා.වි.ස.
04	ලලිත් චන්ද්‍රපාල මයා	ආපදා වලට ඔරොත්තුදීම සම්බන්ධව බංගලාදේශයේ අත්දැකීම් පිළිබඳ ඉගැන්වීම් - බංගලාදේශය : 24/02/2012 සිට 29/02/2012	ශ්‍රී ලංකා රජය

05	එම්.ඩී. දයානන්ද මයා	ජපානයේ ඇතිවූ මහා භූමිකම්පාවෙන් පසු ආපදා වලක්වා ගැනීම සහ විනාශ කළමනාකරණය සඳහා කාලගුණික සේවාව පිළිබඳ සම්මන්ත්‍රණය - ජපානය : 04/03/2012 සිට 10/03/2012	JICA - ජපන් අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය
06	ඩී.ජේ.ඒ. වීරවර්ධන මයා	දේශගුණ දත්ත මගින් ශක්තිමත් වූ ආසියාවේ කෘෂිකර්මය සහ පර්යේෂණ වැඩිදියුනු කිරීමේ ප්‍රමුඛතාවය පිළිබඳ වැඩමුළුව - තායිලන්තය : 11/04/2012 සිට 12/04/2012	WMO - ලෝ.කා.වි.ස.
07	එස්.ආර්. ජයසේකර මයා	කොරියානු සන්නිවේදන, සාගර, කාලගුණික දත්ත ලබාගැනීමේ චන්ද්‍රිකාව මගින් ලබාදෙන දත්ත විශ්ලේශනය සඳහා වන පුහුණුව - කොරියාව : 10/06/2012 සිට 23/06/2012	KOICA - කොරියානු අන්තර්ජාතික සහයෝගිත ඒජන්සිය
08	ඩී.ජී. ප්‍රනාන්දු මිය	- එම -	- එම -
09	එම්.එම්.පී. මෙන්ඩිස් මයා	- එම -	- එම -
10	ජේ.ඒ. තිලකරත්න මයා	- එම -	- එම -
11	කේ.එච්.එම්.එස්. ප්‍රේමලාල් මයා	SARRC කාලගුණික පර්යේෂන ආයතනය විද්‍යාඥ තනතුර - බංගලාදේශය : 10/08/2012 සිට 09/08/2014	SMRC - SARRC කාලගුණික පර්යේෂන ආයතනය
12	එම්.ඒ. සී. දයන්ත මයා	ප්‍රජා මූලික වූ ආපදා කලමනාකරණය, පූර්ව සූදානම සහ මැඩපැවැත්වීමේ උපායමාර්ගන් පිළිබඳ පුහුණු පාඨමාලාව - ඉන්දියාව : 22/08/2012 සිට 181/10/2012	ඉන්දියානු රජය
13	ඒ.ජී.එම්.එම්. විම ලසූරිය මයා	කොරියානු සන්නිවේදන, සාගර, කාලගුණික දත්ත ලබාගැනීමේ චන්ද්‍රිකාව මගින් ලබාදෙන දත්ත විශ්ලේශණය සඳහා වන පුහුණුව - කොරියාව : 02/09/2012 සිට 22/09/2012	KOICA - කොරියානු අන්තර්ජාතික සහයෝගිත ආයතනය
14	ඒ.ආර්. වර්ණසූරිය මිය	කාලගුණ විද්‍යා සේවා ශක්තිමත් කිරීමේ පුහුණුව - ජපානය : 10/09/2012 සිට 08/12/2012	JICA - ජපන් අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සිය
15	ඩී.ජී. ප්‍රනාන්දු මිය	කාලගුණ විද්‍යාඥයින් සඳහා වන අන්තර්ජාතික පුහුණු පාඨමාලාව - චීනය : 17/09/2012 සිට 26/09/2012	CMA - චීන කාලගුණ පරිපාලනය
16	අයි.එම්.එස්.පී. ජයවර්ධන මෙනෙවිය	නිරිත දිග ඉන්දියන් සාගර කලාප සඳහා වන දේශගුණ අනාවැකි පලකිරීමේ සාකච්චා වාරය (SWIOCOF) – ල රියුනියන් : 24/09/2012 සිට 03/10/2012	WMO - ලෝ.කා.වි.ස.
17	ඒ.එල්.කේ. විජේමාන්නගේ මයා	ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය මගින් පවත්වනු ලැබූ පර්යේෂනාත්මක අනාවැකිකරනය (WRF) සඳහා වන පුහුණු වැඩමුළුව - වියට්නාමය : 24/09/2012 සිට 28/09/2012	ADPC - ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය
18	ටී.එම්.එන්. පීරිස් මයා	- එම -	- එම -

19	එච්. ඒ. එස්. යූ. හපුආරච්චි මිය	- එම -	- එම -
20	ඒ.එල්.කේ. විජේමාන්නගේ මයා	ජපාන කාලගුණ ආයතනය මගින් පවත්වනු ලැබූ කාලගුණික තොරතුරු පද්ධතිය (WIS) දියත් කිරීමේ වැඩමුළුව - ජපානය : 22/10/2012 සිට 24/10/2012	JMA- ජපන් කාලගුණ විද්‍යා ඒජන්සිය
21	ඒ.කේ. කරුණානායක මයා	ගුවන් ගමන් සම්බන්ධ කාලගුණ විද්‍යාඥයින් සහ නිරීක්ෂකයින්ගේ නිපුණතාවය ඇගයීම - ඊශ්‍රායලය : 29/10/2012 සිට 02/11/2012	WMO - ලෝ.කා.වි.ස.
22	K.G.M.L.D. සුචරිතරත්න මයා	සාගර නිරීක්ෂණ සහ උපකරණ සලකුණු කිරීමේ (අංශක ලකුණු කිරීම) - ඉන්දියාව : 19/11/2012 සිට 21/11/2012	WMO - ලෝ.කා.වි.ස.
23	ඒ.කේ. කරුණානායක මයා	දේශගුණ තොරතුරු විශ්ලේෂණය පිළිබඳ TCC (ටෝකියෝ දේශගුණ මධ්‍යස්ථානය) පුහුණු සම්මන්ත්‍රණය - ජපානය : 26/11/2012 සිට 30/11/2012	JMA- ජපන් කාලගුණවිද්‍යා ඒජන්සිය
24	ටී.එම්.එන්. පීරිස් මයා මයා	සංඛ්‍යාත්මක අනාවැකිකරන ආකෘති භාවිතය හා ඒවායේ අර්ථ නිරූපනය පිළිබඳ අන්තර්ජාතික පුහුණු වැඩමුළුව - හොංකොං : 03/12/2012 සිට 07/12/2012	WMO - ලෝ.කා.වි.ස.
25	ලලිත් චන්ද්‍රපාල මයා	අප්‍රිකාව සහ දකුණු ආසියාතික ගොවියන් සඳහා වන දේශගුණික සේවාවන් - සෙනෙගල් : 09/12/2012 සිට 12/12/2012	WMO - ලෝ.කා.වි.ස. / USAID
26	එස්.ආර්. ජයසේකර මයා	වාසුළි උත්සර්ජනය අනාවැකි කරණ ප්‍රවීනයන්ගේ පුහුණුව - ඉන්දියාව : 10/12/2012 සිට 21/12/2012	WMO - ලෝ.කා.වි.ස.
27	ඒ.ජී.එම්.එම්. විමලසූරිය මයා	නිවර්තන සුළිසුළං විශ්ලේශනය පිළිබඳ පුහුණුව - ඕමාන් : 17/12/2012 සිට 19/12/2012	WMO - ලෝ.කා.වි.ස.

කාලගුණ විද්‍යාඥ කේ. ඩී සුජීව මයා ලෝ.කා.වි.ස. අනුග්‍රහය යටතේ පිලිපීන විශ්වවිද්‍යාලයේ කාලගුණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලා අවසන්කර 31/05/2012 දින සේවයට වාර්තාකරණ ලදී.

කාලගුණ විද්‍යාඥ පී. එම් ජයකොඩි මිය 01/06/2011 සිට 31/05/2013 දක්වා ලෝ.කා.වි.ස. අනුග්‍රහය යටතේ පිලිපීන විශ්වවිද්‍යාලයේ කාලගුණය පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව හදාරමින් සිටී.

කාලගුණ විද්‍යාඥ පී. වයි. යසරත්න සහ පි. එච්. සී . ද සිල්වා මහතුන් ඉන්දියානු රජයේ අනුග්‍රහය යටතේ ඉන්දියාවේ අහමදාබාත් අභ්‍යවකාශ නියැලුම් මධ්‍යස්ථානයේ (Space Application Centre) චන්ද්‍රිකා කාලගුණ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා 01.08.2012 දින පිටත් වූ අතර පාඨමාලාව අවසන් කර 01.05.2013 දින දිවයිනට පැමිණීමට නියමිතය. කාලගුණ විද්‍යාඥ ජී.කේ. හෙන්දවිතාරණ මහත්මිය ලෝ.කා.වි.ස. අනුග්‍රහය යටතේ පිලිපීනයේ, පිලිපීන විශ්වවිද්‍යාලයේ කාලගුණ විද්‍යා විද්‍යාපති උපාධි පාඨමාලාව (IESM) 08.11.2012 දින සිට හදාරමින් සිටින අතර 09.11.2014 දින පෙරලා දිවයිනට පැමිණීමට නියමිතය.

ආ). ජාත්‍යන්තර / කලාපීය රැස්වීම් සඳහා සහභාගීත්වය

2012 වර්ෂයතුල ජාත්‍යන්තර / කලාපීය රැස්වීම් සඳහා සහභාගීත්වය

අංකය	නම	විස්තර	ආධාර සපයන ලද ආයතනය
01	ඩී.ඒ ජයසිංහආරච්චි මයා	ආසියා පැසිපික් ජාලය දකුණු ආසියාතික උප කළාපීය සහයෝගීතාවය පිළිබඳ 3 වන රැස්වීම සහ ව්‍යාපෘති නිර්මානකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව - භූතානය : 16/01/2012 සිට 19/01/2012	APN - ආසියා පැසිපික් ජාලය
02	ඒ.ආර්. වර්ණසූරිය මිය	ඉන්දියන් සාගරයේ සුළිසුළං සහ දේශගුණ විපර්යාස සඳහා 2වන අන්තර්ජාතික සමුළුව - ඉන්දියාව :14/02/2012 සිට 17/02/2012	ලෝ.කා.වි.ස.
03	එස්.එච්. කාරියවසම් මයා	සුළි කුණාටු සඳහා වන ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේ /ESCAP 39වන අනු කමිටු සැසි වාරය - මියන්මාරය : 05/03/2012 සිට 09/03/2012	ශ්‍රී ලංකා රජය
04	ඩී.ජේ.ඒ. වීරවර්ධන මයා	2012 ලෝක කාලගුණ විද්‍යා දිනය සැමරීමේ සමුළුව - 20/03/2012 සිට 24/03/2012 : ොකාරියාව	KMA- කොරියානු කාලගුණවිද්‍යා ඒජන්සිය
05	අයි.එම්.එස්.පී. ජයවර්ධන මෙනෙවිය	නිරිත දිග මෝසම් සෘතුව සඳහා වන වර්ෂාපතන අනාවැකි පලකිරීම පිළිබඳ වැඩමුළුව සහ දකුණු ආසියාතික සෘතු සඳහා වන දේශගුණික අනාවැකි පලකිරීම පිළිබඳ තුන්වන සාකච්චා වාරය - ඉන්දියාව : 16/04/2012 සිට 20/04/2012	ලෝ.කා.වි.ස. / ඉන්දියානු කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
06	එස්.එච්. කාරියවසම් මයා	ආපදා කලමනාකරණය පිළිබඳ නායකත්ව කාර්යභාරය - ඇමෙරිකාව : 21/04/2012 සිට 28/04/2012	ඇමෙරිකානු රජය
07	එස්.එච්. කාරියවසම් මයා	RIMES 5 වන සභාවාරය සහ අමාත්‍යවරුන්ගේ පළමු රැස්වීම - ඉන්දියාව : 18/06/2012 සිට 21/06/2012	RIMES සහ ඉන්දියානු රජය
08	එස්.එච්. කාරියවසම් මයා	කුණාටු පිළිබඳ පර්යේෂණයන් සඳහා වන සාර්ක් විද්‍යාත්මක සම්මන්ත්‍රණය සහ සාර්ක් IPC රැස්වීම - පකිස්තානය : 05/09/2012 සිට 06/09/2012	SMRC - SAARC කාලගුණික පර්යේෂණ ආයතනය
09	ඩී.ජේ.ඒ. වීරවර්ධන මයා	සාර්ක් කාලගුණ පර්යේෂණ ආයතනයේ 18 වන පාලක මණ්ඩල රැස්වීම - බංගලිදේශය : 12/09/2012 සිට 13/09/2012	SMRC – SAARC කාලගුණික පර්යේෂණ ආයතනය
10	එස්.එච්. කාරියවසම් මයා	ව්‍යාපෘති උපදේශාත්මක රැස්වීම, වටමේස සාකච්ඡාව සහ දේශන මාලාව - තායිලන්තය : 04/10/2012 සිට 05/10/2012	ADPC - ආසියානු ආපදා පෙර සූදානම් මධ්‍යස්ථානය
11	එස්.එච්. කාරියවසම් මයා	කළාපීය ක්ෂණික ගංවතුර සඳහා මහපෙන්වීමේ පද්ධතිය පිහිටුවීම සඳහා වන සැලසුම් කිරීමේ රැස්වීම - නේපාලය : 26/11/2012 සිට 28/11/2012	ICIMOD – කඳු ආශ්‍රිත සංවර්ධනය සඳහා ඒකාබද්ධ අන්තර්ජාතික මධ්‍යයස්ථානය

(ඇ) දේශීය පුහුණු කිරීම

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA), ශ්‍රී ලංකා පදනම් ආයතනය සහ වෙනත් ආයතන මඟින් මෙහෙයවනු ලැබූ ධාරිතා වර්ධන වැඩ සටහන් සඳහා සහකාර අධ්‍යක්ෂ (පාලන), කාලගුණ විද්‍යාඥයින් 4ක්ද, ගණකාධිවරිය, කළමණාකරණ සහකාර සේවා නිලධාරීන් 28ක්ද, කාර්යාල සේවක සේවයේ නිලධාරිනියක් සහ රියදුරු සේවක මණ්ඩලයේ 06 දෙනකුද සහභාගී කරවා ඇත. රාජ්‍ය භාෂා පුහුණු වැඩසටහන යටතේ නිලධාරිනියන් 2ක් දෙමළ භාෂා පුහුණුවට සහභාගී වී ඇත. ඉකුත් වසරේ බඳවා ගත් කාලගුණ විද්‍යා නිරීක්ෂක (පුහුණු) නිලධාරීන් ගේ පුහුණු කිරීම් අගෝස්තු මස වනවිට අවසන් වීය . සන්තතික පුහුණු වැඩසටහන යටතේ ශ්‍රී ලංකා තාක්‍ෂණ සේවා නිලධාරීන් **37**ක් සඳහා දෙදින නේවාසික පුහුණු වැඩසටහනක් (ගන්නොරුව කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානයේදී) සහ නිලධාරීන් **55**ක් සඳහා දෙදින පුහුණු වැඩසටහනක් (කොළඹ ප්‍රධාන කාර්යාලයේදී) පවත්වා ඇත. නවක කාලගුණ විද්‍යාඥයින් තිදෙනාට කාලගුණ විද්‍යාව පිලිබඳ මූලික පුහුණුව දෙපාර්තමේන්තු තුලදීම ලබාදෙන ලදී.

(ඈ) පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන්

ගගන කාලගුණ විද්‍යා සේවාව සඳහා තත්ත්ව කළමණාකරන පද්ධති පිලිබඳව සිව්දින අන්තර්ජාතික පුහුණු වැඩසටහනක් ලෝක කාලගුණ විද්‍යා සංවිධානයේද සහයෝගය ඇතිව කොළඹ දී පවත්වන ලදී.

විවිධ ආයතන මඟින් විවිධ ප්‍රදේශ වල පවත්වන ලද කාලගුණය,දේශගුණ විපර්යාස හෝ ස්වභාවික ආපදා සම්බන්ධව වැඩමුළු, සම්මන්ත්‍රණ සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 20කට අධික ප්‍රමාණයක් සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

RIMES මූල්‍ය ආධාර යටතේ මෝසම් කතිකා වැඩමුළු 2ක් නිරිත දිග සහ ඊසාන දිග මෝසම සඳහා පවත්වන ලදී. නිරිත-දිග මෝසම සහ ඊසාන දිග මෝසම ආරම්භ වීමට පෙර එම කාලය තුලදී අපේක්ෂාකළ හැකි කාලගුණික තත්වයන්, වෙනස්කම් සහ අපද පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා ජනමාධ්‍ය මාධ්‍ය සාකච්ජාවක් පවත්වන ලද අතර, ඔක්තෝම්බර් මස අවසාන සතියේදී ත්‍රිකුණාමලයට නැගෙනහිර මුහුදේ හටගත් “නීලම්” සුළි කුණාටුව පිළිබඳව දැනුම්වත් කිරීම සඳහා ද ජනමාධ්‍ය සඳහා මාධ්‍ය සාකච්ජාවක් පවත්වන ලදී.

පාසැල් සහ අනිකුත් ආයතන 19ක් විසින් සංවිධානය කල ප්‍රදර්ශන සඳහා ප්‍රදර්ශන භාණ්ඩ සහ සම්පත් දායකයන් හෝ අවශ්‍ය පුහුණුව ලබා දෙමින් කාලගුණ විද්‍යාව සම්බන්ධව දැනුම වැඩි දියුනු කිරීමට දායක වන ලදී.

24. වෙනත් ක්‍රියාකාරකම්

අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, ඔයාමඩුව ප්‍රදේශයේ පවත්වන ලද "දැයට කිරුළ" ප්‍රදර්ශණය සඳහා දෙපාර්තමේන්තුවේ සහභාගිත්වය සපයන ලදී. මෙම ප්‍රදර්ශනයට සමගාමීව වර්ෂාපතන මාපක 10ක් ස්ථාපිත කරන ලදී.

මාර්තු 23 වැනි දිනට යෙදෙන ලෝක කාලගුණ විද්‍යා දිනයේ 2012 වසරේ තේමාව “අපගේ අනාගතය සවිබල ගැන්වීම සඳහා කාලගුණය, දේශගුණය සහ ජලය ” වූ අතර පාසැල් සිසුන්, කාලගුණ විද්‍යා සේවා ලබාගන්නා ආයතන වල සහ ජනමාධ්‍ය ආයතන වල නියෝජිතයින් සහ දෙපාර්තමේන්තුවේ විශ්‍රාම ගිය නිලධාරීන්ගේ සහභාගිත්වය ඇතිව එදින සමරන ලදී.

ආපාදා වලට ලක්විය හැකි පහත් බිම් සහිත වෙරළාසන්න ප්‍රදේශ වලට අදාලව RIMES ආයතනය මගින් සිදුකරන ලබන නියාමක ව්‍යාපෘතියට සම්බන්ධ දැනුම්වත් කිරීමේ වැඩසටහන් වලට දෙපාර්තමේන්තුවේ දායකත්වය සපයන ලදී.

25. ආදායම

වසර තුළ දී රුපියල් 6,147,077.00 ක ආදායමක් ලැබී ඇති අතර මේ සඳහා ප්‍රධාන වශයෙන් දේශගුණික දත්ත සහ කාලගුණ තොරතුරු සැපයීමෙන් ලැබූ ආදායම දායක වී ඇත.

26. වියදම

විවිධ වැඩ සටහන් යටතේ දරන ලද වියදම් පහත දැක්වෙන ඇමුණුම් වල දක්වා ඇත.

2012 වසරේ ප්‍රතිපාදන අනුව පුනරාවර්තන වියදම්

වයාපෘතිය 1 - කාලගුණ විද්‍යා සේවා සඳහා — ඇමුණුම 1

2012 වසරේ ප්‍රතිපාදන අනුව ප්‍රාග්ධන වියදම්

වයාපෘතිය 1 - කාලගුණ විද්‍යාත්මක සේවා සඳහා — ඇමුණුම 2

වයාපෘතිය 1 - ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘති

2012 වසරේ අපේක්ෂිත සහ සැබෑ අදායම් ගිණුම — ඇමුණුම 3

2012 වසරේ අත්තිකාරම් ගිණුම් සාරාංශය — ඇමුණුම 4

27. ප්‍රසම්පාදන

- පරිගණක හා ආශ්‍රිත උපකරණ සඳහා - රු. 1,667,625.00
- කාලගුණවිද්‍යා උපකරණ සඳහා - රු. 7,250,342.86
- ස්වයංක්‍රීය කාලගුණ පද්ධති සඳහා අමතර කොටස් මිලදී ගැනිම - රු. 2,876,430.35
- ඩොප්ලර් රේඩාර් පද්ධතිය හා අනුබද්ධිත වියදම් සඳහා - රු. 10,249,394.83

28. ප්‍රකාශණ

පහත දැක්වෙන ප්‍රකාශන වසර තුළදී නිකුත් කරන ලදී.

- දෙපාර්තමේන්තුවේ වාර්ෂික පාලන වාර්තාව
- මාසික කාලගුණ සංක්ෂිප්ත වාර්තාව
- ඉර නැගීම, ඉර බැසීම, සඳ නැගීම, සඳ බැසීම හා පහන් දල්වන වෙලාවන්
- සති පතා කාලගුණ විමසුම - වෙබ් අඩවිය ඔස්සේ
- කොළඹ, ගාල්ල සහ ත්‍රිකුණාමලය ප්‍රදේශ වල මුහුදේ වඩදිය-බාදිය මාසික වගු

29. කෘතඥතාව

විවිධ ව්‍යාපෘති, වැඩසටහන් සහ රැස්වීම් වල දී, අප ආයතනයට සහයෝගය දැක්වූ සියළුම රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන සහ පුද්ගලයින්ට මාගේ කෘතඥතාවය පළ කරමි. තවද, කාලගුණ තොරතුරු සාමාන්‍ය ජනතාව වෙත ගෙනයාමේ දී ජනමාධ්‍ය විසින් සිදුකරන ලද සේවය වෙනුවෙන් මාගේ ස්තුතිය පල කර සිටිමි. අවසාන වශයෙන්, අප්‍රමාදී සහයෝගයෙන් සහ අවංකව සේවය සැලසීම පිළිබඳව දෙපාර්තමේන්තුවේ සියළුම සේවක සේවිකාවන්ට මාගේ කෘතඥතාවය පලකරමි.

එස්.එච්. කාරියවසම්,
අධ්‍යක්ෂ ජනරාල්,
කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

ඇමුණුම 1

2012 ප්‍රතිපාදන- පුනරාවර්ථන වියදම් (රු)

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 304 වැඩසටහන **- 02** ව්‍යාපෘති අංක **01**

කාණ්ඩය		ව්‍යාපෘතිය -01	
		ප්‍රතිපාදන රු.	වියදම රු.
පුද්ගලික පඩිනඩි		118,900,000.00	118,388,570.00
වෙනත් පුනරාවර්තන		63,717,000.00	58,193,147.00
	ගමන් වියදම්	3,050,000.00	2,382,759.00
	සැපයීම්	16,375,000.00	13,119,602.00
	නඩත්තු වියදම්	10,025,000.00	8,846,198.00
	සේවා	29,864,000.00	26,233,937.00
	මාරු කිරීම	8,036,000.00	7,610,651.00
මුළු වියදම		186,250,000.00	176,581,717.00

ඇමුණුම 2

2012- ප්‍රතිපාදන මූලධන වියදම් (රු)

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 304 වැඩසටහන **- 02** ව්‍යාපෘති අංක **01**

වැය විෂය සංකේතය	වැය විෂය විස්තරය	2012 ශුද්ධ ප්‍රතිපාදන රු :	2012 වියදම රු :
ව්‍යාපෘතිය **01**	**එකතුව (ව්‍යාපෘතිය 01)**	348,119,395.00	157,716,051.00
	කාලගුණ විද්‍යා සේවා		
	එකතුව	348,119,395.00	157,716,051.00
	පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	5,500,000.00	1,861,162.00
2001	**ගොඩනැගිලි හා ඉදිකිරීම්**	5,500,000.00	1,861,162.00
	මූලධන වත්කම් අත්පත් කරගැනීම	340,999,395.00	154,601,183.00
2102	**ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ**	3,100,000.00	2,750,441.00
2103	**යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ**	325,549,395.00	144,073,432.00
2104	**ගොඩනැගිලි හා ඉදිකිරීම්**	12,000,000.00	7,675,280.00

2105	**ඉඩම් හා ඉඩම් වැඩිදියුණු කිරීම**	350,000.00	102,030.00
	හැකියා වර්ධනය	400,000.00	367,842.00
2401	**පුහුණු කිරීම් හා හැකියා වර්ධනය**	400,000.00	367,842.00
	වෙනත් මූලධන වියදම්	1,220,000.00	885,864.00
2502	**ආයෝජන**	1,220,000.00	885,864.00
	විදේශාධාර ව්‍යාපෘතිය	-	
	එකතුව	296,300,000.00	123,599,550.00
	මුලධන වත්කම් අත්පත්කර ගැනීම		
2103	**යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ**		
	13.විදේශාධාර ප්‍රදාන	221,000,000.00	117,560,638.00
	17.විදේශාධාර සබැඳි දේශිය අරමුදල්	75,300,000.00	6,038,912.00

ඇමුණුම 3

2012 අපේක්ෂිත සහ සැබෑ අදායම් ගිණුම

කාලගුණ විද්‍යා දෙපාර්තුමේන්තුව

ශීර්ෂය - 304 **වැඩසටහන - 02** **ව්‍යාපෘතිය - 01**

ආදායම් සංකේතය	විස්තරය	2012 ආදායම	
		ඇස්තමේන්තුව රු:	සත්‍ය රු:
20.02.01.01	රජයේ වත්කම් වලින් ලැබෙන රජයේ ගොඩනැගිලි කුලී	500,000.00	501,133.00
20.02.01.99	රජයේ වත්කම් වලින් ලැබෙන අදායම - අනෙකුත් කුලී	12,600.00	12,600.00
20.02.02.99	පොලිය - වෙනත්	1,600,000.00	1,409,757.00
20.03.02.99	විකිණුම් හා ගාස්තු - පරිපාලනමය ගාස්තු - විවිධ	6,300,000	5,933,490.00
20.03.99.00	විකිණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	400,000.00	213,587.00
එකතුව		8,812,600.00	8,070,567.00

ඇමුණුම 4

<u>**අත්තිකාරම් ගිණුම් සාරාංශය- 2012**</u>

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

ශීර්ෂය - 304 **වැඩසටහන - 02** **ව්‍යාපෘති අංක 01**

අයිතමය	2012 ඇස්තමේන්තු රු :	2012 සත්‍ය රු :
රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම		
වියදමෙහි උපරිම සීමා	15,000,000.00	3,572,989.00
ලැබීම් වල අවම සීමා	5,500,000.00	8,301,283.00
හර ශේෂයන්ගේ උපරිම සීමා	60,000,000.00	31,441,436.00